මගේ අංකය :- අධිසේකොස/කඩඉම්/2022

සියලුම,
සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරුවරුන්/මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්/මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්/ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත.

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක I වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018**

අංක 2088/26 හා 2018 සැප්තැම්බර් මස 11 දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 10.10, 15.3.4 සහ 15.3.5 වගන්ති සහ "ඒ" පරිශිෂ්ඨයෙහි 01.2 හි දැක්වෙන කොන්දේසි හා විෂය නිර්දේශය අනුව අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය කොළඹ දී පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක I වන ශ්‍රේණියට 2018.12.31 දිනට පෙර උසස්වීම් ලද නිලධාරීන් පමණක් මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුස්සෝ වෙති.

- අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක I වන ශ්‍රේණියේ නිලධාරීන් එම ශ්‍රේණියට උසස්වීම ලබා වසර 05 ක් ගත වීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

02. විභාගය පිළිබඳ විස්තරය

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත්වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කළමනාකරණය | පැය 02 | 100 | 40 |
| 02 | පරිවර්තනය | පැය 02 | 100 | 40 |

03. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|---|
| 01 | කාර්යාල කළමනාකරණය | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි, කාර්යාල ක්‍රම හා කාර්යාල සංවිධානය පිළිබඳ අවබෝධය මැනීම. |
| 02 | පරිවර්තනය | (1) සිංහල/ඉංග්‍රීසි භාෂාවට<br>ඉංග්‍රීසි/ සිංහල භාෂාවට |
| | | (2) සිංහල/දෙමළ භාෂාවට<br>දෙමළ/ සිංහල භාෂාවට |
| | | (3) දෙමළ/ ඉංග්‍රීසි භාෂාවට<br>ඉංග්‍රීසි/ දෙමළ භාෂාවට |

(අයදුම්කරුගේ පත්වීම අනුව ඉහත 02 හි (1), (2), (3) ප්‍රශ්නපත්‍ර අතරින් අදාළ ප්‍රශ්න පත්‍රය තෝරා ගත යුතුය.)

04. මෙම ප්‍රශ්න පත්‍ර බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න ,රචනා ප්‍රශ්න හා/හෝ ප්‍රායෝගික ප්‍රශ්න වලින් සමන්විත වනු ඇත.

05. අධිකරණ භාෂණ පරිවර්තක සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් නිලධාරීන් විසින් 'කාර්යාල කළමනාකරණය' විෂයයේ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයිය යුතුය.

06. පහත 07 ඡේදයේ සඳහන් කොන්දේසි වලට යටත්ව තමන් කැමති වන්නේ නම්, එක් එක් විෂය සඳහා වෙන් වෙන් වශයෙන් එකිනෙකට වෙනස් වූ වාර වල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිය. එතකුදු වුවත් සාමාර්ථයක් සඳහා එක් එක් විෂය සඳහා අවම වශයෙන් සියයට හතළිහක් (40%) නිලධාරීන් විසින් ලබා ගත යුතු වේ.

07. මෙම විභාගයට ප්‍රථම වරට ඉල්ලුම්කරන අයදුම්කරුවන් විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එකවරකදී සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් හෝ එක් විෂයයකට වඩා පෙනී සිටින්නේ නම් රු. 500 ක් ද එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු 250 ක් ද විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. මීට ප්‍රථම මෙම විභාගය සඳහා ඉල්ලුම්කර ඉදිරිපත් නොවූ නිලධාරීන් දෙවන වතාවට ඉදිරිපත් වන සේ සලකා විභාග ගාස්තු ගෙවා විභාගයට අයදුම්කල යුතුය. කවර කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

08. මෙම විභාග ගාස්තු **අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්** නමින් මහජන බැංකුව, වෙල්ල වීදිය ශාඛාවේ පවත්වාගෙන යන ගිණුම් අංක **297100199025039** ට බැර කර ලබා ගන්නා ලදු පත අයදුම්පත්‍රයෙන් වෙන් කර ගැනීමට හැකි වන පරිදි අමුණා එවිය යුතුවේ.

09. මේ සමඟ ඇති ආකෘති පත්‍රයට අනුව 11 ½ " X 8 ½ " ප්‍රමාණයේ ඝන කඩදාසියේ සකස් කොට සම්පූර්ණ කරන ලද අදාල නිලධාරීන්ගේ අයදුම්පත්‍ර ඔබේ නිර්දේශය සමග **2022 ජූනි මස 17** වන දින හෝ එදිනට පෙර ලියාපදිංචි තැපැලෙන් මෙම කාර්යාලයට එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" ශ්‍රී ලංකා අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක I ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018 "** යනුවෙන් සඳහන් කළ යුතුය.

10. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර හා නිසි අයුරින් සම්පූර්ණ නොකළ අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. මෙම ලිපිය ඔබ අධිකරණයේ අදාල සියලුම නිලධාරීන්ට දැන්වීමට කටයුතු කරන්න.

සටහන: උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 15.3.4 සහ 15.3.5 වගන්ති පහත පරිදි වේ.

15.3.4 මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර පැවති සේවා ව්‍යවස්ථාව යටතේ අධිකරණ ලිපිකරු, අධිකරණ ලඝු ලේඛක, අධිකරණ යතුරු ලේඛක සේවා වල I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩයිම් විභාගය සම්පූර්ණ කරන ලද නිලධරයන් සහ අධිකරණ භාෂණ පරිවර්තක සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් මෙම සේවා ව්‍යවස්ථාව යටතේ අධිකරණ කළමනාකරණ සහකාර (අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක සේවාවන්ට අයත්) I වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩයිම් විභාගය සමත්/ නිදහස් වූවා ලෙස සැලකේ.

15.3.5 නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ නොකරන ලද අධිකරණ ලිපිකරු, අධිකරණ ලඝු ලේඛක, අධිකරණ යතුරු ලේඛක සේවාවල I ශ්‍රේණියේ නිලධරයන්ට පැරණි ව්‍යවස්ථාව යටතේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීම සඳහා නියමිත දින සිට වසරක සහන කාලයක් ලබා දෙනු ලැබේ. එම කාලය තුල කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කර ගැනීමට අපොහොසත් වන නිලධරයන් සහ මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පසුව අධිකරණ භාෂණ පරිවර්තක I ශ්‍රේණියට උසස්වීම් ලබන නිලධරයන් මෙම ව්‍යවස්ථාව යටතේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ (අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක සේවාවන්ට අයත්) I වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

පී.එම්.ටී. බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

පී.එම්.ටී. බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

අත්/කලේ: එච්.එස්.සෝමරත්න
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

2022 ජූනි මස 03 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

SPECIMEN APPLICATION FORM
Efficiency Bar Examination for Officers in Court Interpreter Grade I of the
Court Management Assistant Service– 2018

---

01. Name:
  1:1 Name with initials Mr./Mrs./Miss: ..........................................................................
  (In block capital letters)
  1:2 Full name: ....................................................................................................
  (In English capital letters)
  1:3 Full name: ....................................................................................................
  (In Sinhala/Tamil)
  1:4 National Identity Card Number: ..............................................................

02. Permanent address: ..........................................................................................
  (In block capital letters)
  2:1 Permanent address: ..........................................................................................
  (In Sinhala/Tamil)
  2:2 Official address ..........................................................................................
  (In English capital letters)
  2:3 Official address: ..........................................................................................
  (In Sinhala/Tamil)

03. Date of Birth : Date ☐☐ Month ☐☐ Year ☐☐☐☐

04. Personal File No : EA/PF/2 /.........

05. Date of promotion to the post of Court Interpreter Grade I : ................................

06. (i) Medium in which you sit for the examination:

☐

(Denote with "S" for Sinhala, "T" for Tamil)
Note : Candidates shall answer the 'Office Management' question paper in the medium in which they sat the examination to enter the relevant service.

(ii) The category of the appointment:
(Please insert '✓' to the relevant cage.)

Sinhala/ Tamil ☐
Sinhala/English ☐
Tamil/ English ☐

07. Please give details of subject and year you sat the exam before:

| Year | Subject |
|---|---|
| | I.<br>II.<br>III. |
| | I.<br>II.<br>III |

08. Subject / Subjects you are now offering to sit for:

(i) ..............................................

(ii) ...................................

(iii) ...................................

09. The value of payment made as Examination fee: ............................................................

I state that the particulars given are accurate and I am entitled to sit for the Examination in the medium/ category mentioned in the paragraph 6 above. I certify that I am appearing for the Examination for the first time / I have annexed the receipt obtained after making the appropriate payment. I agree to abide by the rules governing the Examination.

...............................
Date

.........................................
Signature of the Applicant

Note: Applicant should sign before the Head of the Department/ Registrar of the relevant court.

---

**Attestation**

I hereby certify that Mr./Mrs./Miss.......................................................................................................
who is a grade I Court Interpreter is personally known to me and signed before me on .............................

......................................
Signature of the Registrar

Date: .......................................
Name: ....................................
Designation: ............................
Address: ...................................

---

**Certificate of the Head of the Department**

I certify that,

01. The particulars furnished above were checked and found to be accurate.

02. The officer sits for this Examination for the first time/ has made the correct payment as Examination Fee.

03. The applicant is eligible to sit for this Examination.

Designation: ...........................

Date: .......................................

......................................
Signature of the Head of the Department